www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඇෆ්ගනිස්ථාන යුද්ධය සඳහා වන "මානවවාදී" උද්ඝෝෂනය

## The "humanitarian" campaign for the war in Afghanistan

**2010 අගෝස්තු 10**

ඇමරිකානු මැදිහත්වීමේ මිනීමරු ස්වභාවය සැඟවීම සඳහා තලිබාන් අපරාධයන් පිලිබඳ ඒක පාර්ශ්වික ප්‍රචාරයක් භාවිතා කරමින් ඇෆ්ගනිස්ථාන යුද්ධයට එරෙහි මහජන විරුද්ධත්වය මැඩීමට එක්සත් ජනපද මාධ්‍ය පූර්න පරිමාන ආයාසයක් දියත් කොට ඇත. තම තලිබාන් ස්වාමි පුරුෂයා විසින් අංග ඡේදනය කරන ලද තරුන කාන්තාවක් පෙන්නුම් කරමින් ටයිම් සඟරාවේ මුල් පිටුවෙන් ආරම්භ කෙරුනු මාධ්‍ය ප්‍රහාරය මේ වනවිට නාභිගතව තිබෙන්නේ පසුගිය සිකුරාදා ඊසානදිග බදක්ෂාන් පලාතේ වෛද්‍ය උපකාරක සේවකයන් 10ක් ඝාතනය කිරීම කෙරෙහිය. එම දහදෙනාගෙන් හය දෙනෙක් ම ඇමරිකානු ජාතිකයෝ වෙති.

නිසැකයෙන් ම මෙම සිද්ධි දෙක ම මානව ඛේදවාචකයන් වේ. එහෙත් ඒවා වඩාත් නරුම ආකාරයකින් යොදාගනු ලබන්නේ ජනගහනයෙන් පැහැදිලි බහුතරයක් යුද්ධය ගැන සතුරු ආකල්පයක් ගන්නා සහ ක්ෂනික එක්සත් ජනපද ඉවත් වීමකට කැමැත්ත දක්වන තතු යටතේ එම යුද්ධය අවිනිශ්චිත කාලසීමාවක් දිගට ම කරගෙන යාම පිලිගනුවස් ඇමරිකානු ජනතාව බියවැද්දීමට ය.

ටයිම් සඟරාවේ ජූලි 29 දින කලාපය, සිය ස්වාමි පුරුෂයා වෙතින් පැනයාමට තැත්කිරීම නිසා නාසය සහ කන් කපා දමන ලද තරුන කාන්තාවගේ ඡායාරූපය ''අප ඇෆ්ගනිස්ථානයෙන් ඉවත් වුවහොත් කුමක් සිදු වේ ද'' යන හිසින් යුතුව පල කරමින් උද්ඝෝෂනයේ නිල ආරම්භය සටහන් කලේ ය. මෙහි දේශපාලන පනිවුඩය සැකයකට ඉඩක් නො තබයි: එක්සත් ජනපදය ඇෆ්ගනිස්ථානයෙන් ඉවත් විය යුතු ය යනුවෙන් උද්ඝෝෂනය කරන්නෝ ඇෆ්ගන් කාන්තාව මස් කඩයට අත්හැර දමති.

පිලිකුල දනවන ඡායාරූපය සඟරාවේ පලකිරීම නිසා අසහනයට පත්වන පාඨකයන්ට පහත සඳහන් දෑ ලියමින් කලමනාකාර කර්තෘ රික් ස්ටෙන්ජල් පහත දැක්වෙන විස්තර කිරීම ඉදිරිපත් කලේ ය: "අප සියලු දෙනාට ම බලපාන සහ අප සියලු දෙනා ම සම්බන්ධ වන යුද්ධයක දී සිදුවෙමින් පවතින්නේ සහ සිදුවිය හැක්කේ කුමක්ද යන යථාර්ථය දැක ගැනීමට මෙම ඡායාරූපය කවුලුවක් යයි මට හැඟුනි. තලිබානය කාන්තාවන්ට සලකන්නේ කෙසේදැයි යන්න නො තකා හරිනවාට වඩා පාඨකයන්ට එය මුනගැස්සවීමට මම කැමැත්තෙමි. ඇෆ්ගනිස්ථානය තුල එක්සත් ජනපදය සහ එහි සහායකයින් කල යුත්තේ කුමක්දැයි යන්න පිලිබඳව ජනතාව සිය මනස සකසා ගනිද්දී ජනතාව යථාර්ථය දැනගත යුතු යයි මම හඟිමි.

එහෙත් වෙනස් ප්‍රශ්නයක් ඇසීම සාධාරන ය. එක්සත් ජනපද ගුවන් ප්‍රහාර, මිසයිල, කාලතුවක්කු සහ මෝටාර් බෝම්බ මගින් ඝාතනය කරන ලද අහිංසක ඇෆ්ගන් මිනිසුන්, ගැහැනුන්, සහ ලමුන් දහස් ගනනකගෙන් කිසිවකුගේ ඡායාරූප ටයිම් සඟරාවේ කතුවරයා එහි මුල් පිටුවේ පල නො කලේ ඇයි? තෙල් ටැංකියක් පුපුරුවා හල එක් ගුවන් ප්‍රහාරයක දී ජනයා 140 ක් පිලිස්සූ කුන්දූස් සිද්ධිය ඔහුට තෝරාගත හැකිව තිබිනි. නැතහොත් බෝම්බ සහ මිසයිල මගින් තරුන මනාලිය ද ඇතුලත්ව 47 දෙනෙකු කැබලි කරන ලද නැගෙනහිර නන්ගර්හාර් පලාතේ මංගල උත්සවය තෝරාගත හැකිව තිබිනි. එසේත් නැතහොත් හෙරට් පලාතේ අවමංගල උත්සවයක දී එක්සත් ජනපද හෙලිකොප්ටර් යුද යානා මගින් වෙඩි තැබූ 90 දෙනා හෝ මෑත දී විකිලීක්ස් වෙබ් අඩවිය නිකුත් කල තනිපුද්ගල සහ කුඩා පරිමාන සිවිල් ඝාතන සිය ගනනකගෙන් ඕනෑම එකක් තෝරාගත හැකිව තිබිනි.

එලැඹෙන දශක ගනනාවක් පුරා ඇමරිකානු ප්‍රවෘත්ති සඟරාවල මුල් පිටු පිරවීමට ඉරාකයේ ඇෆ්ගනිස්ථානයේ එවැනි අධිරාජ්‍යවාදයේ ගොදුරු ඕනෑ තරම් තිබේ. එහෙත් මාධ්‍ය පාලනය කරන යෝධ සංගත යෙදී සිටින්නේ ඇමරිකානු ජනතාවට ඔවුන්ගේ නාමයෙන් කරන අපරාධ පිලිබඳව දැනුවත් කිරීමේ නො වේ. මූල්‍ය ප්‍රභූස්ථරය සහ එහි දේශපාලන නියෝජිතයන් විසින් තීරනය කරනු ලබන පිලිවෙත්වල අවශ්‍යතාවලට අවශ්‍ය පරිදි මහජන මතය සැකසීම ඔවුන්ගේ කර්තව්‍යය වන අතර එම කර්තව්‍යය වෙනුවෙන් වෙහෙසී වැඩෙහි යෙදෙති.

වෙනත් මට්ටමක දී ද ටයිම් මුල් පිටුව බොරුවක් වේ. තලිබාන් පාලනය (එමෙන් ම බොහෝදුරට එක්සත් ජනපද පිටුබලය ලබන කර්සායි තන්ත්‍රය යටතේ සැහෙන දුරට ද) යටතේ කාන්තාවන්ට බියකරු ලෙස සැලකීම මත් දශක තුනක කාලයක් පුරා ඇෆ්නිස්ථානය තුල ඇමරිකාව කල මැදිහත් වීම්වල නිෂ්පාදිතයකි. සෝවියට් පිටුබලය ලත් තන්ත්‍රය යටතේ අවම වසයෙන් නාගරික ප්‍රදේශ තුල කාන්තාවන්ටවත් සැලකිය යුතු අයිතිවාසිකම්, අධ්‍යාපනය සහ සමාජ තත්වයක් පැවති අතර එම තන්ත්‍රයට එරෙහිව විරුද්ධත්වය රැලිකිරීමට කාටර් සහ රීගන් පරිපාලන කටයුතු කලහ. ඉස්ලාමීය ලෝකයේ වඩාත් ම දක්ෂිනාංශික කොටස්වලින් ඇදගන්නා ලද මුජාහිඩීන්වරුන් සීඅයිඒය විසින් ත්‍රස්ත ක්‍රියාකාරකම් සඳහා පුහුනු කොට ඇෆ්ගනිස්ථානයට යවන ලද අතර ඒ සඳහා මුදල් යොදනු ලැබුවේ සවුදි අරාබියයි. ඔවුන් අතරට අනාගත අල් කයිඩා නායක ඔසාමා බින් ලාඩන් අයත් විය.

සවුදි රාජාන්ඩුව වැනි එක්සත් ජනපදයේ

සමීපතම සගයන් හැරුනුකොට වෙනත් අය අතර එකල පුලුල් සහයෝගයක් නො තිබුනු ඉස්ලාමීය මූලධර්මවාදයේ සංස්කරනයක් එක්සත් ජනපද ආන්ඩුවෙන් අවුලුවා ව්‍යාප්ත කරන ලදී. සෝවියට් සංගමය ඉවත්වීමෙන් පසු මුජහිඩීන් යුද කන්ඩායම් අතර සිවිල් යුද්ධයට ඇදවැටුනු විට එක්සත් ජනපදයේ සහාය සහිත පාකිස්තාන මිලිටරිය තලිබාන්වරුන්ව වඩාත් විශ්වාසදායක ආදේශකයක් ලෙස ඉස්මත්තට ගන්නා ලදී. මේ අනුව අල් කයිඩා මෙන් ම තලිබාන් ද සෝවියට් සංගමය සමග සීතල යුද්ධයේ දී ඇතිදැඩි කරන ලදුව පසුව සිය නිර්මාපකයාට එරෙහිව හැරුනු ෆ්‍රැන්කන්ස්ටීනියානු යක්ෂයෙකි.

බදක්ෂාන් හි දී වෛද්‍ය සේවකයින් ඝාතනය කිරීම දැන් මෙම ඉහවහා ගිය මාධ්‍ය ආවරනයේ කේන්ද්‍රය බවට පත්ව තිබේ. ඝාතකයින්ගේ සබඳතා ඇතුලු ඝාතනයේ බොහෝ මූලික කරුනු තවමත් අවිනිශ්චිතව පවතී. තලිබානය වගකීම භාරගත්ත ද සත්‍ය වසයෙන්ම සොරකම් සඳහා පෙලැඹුනු චෞරයන් මෙයට සම්බන්ධ යයි අදහස් පල වේ. නිරායුධ බටහිර සහනාධාර කම්කරුවන් සහ කැරලිකාරී හමුදා අතර සිදුවන බොහෝ අනෙක් මුනගැටීම් කප්පම් සහ ප්‍රචාරක කටයුතු සඳහා පැහැරගැනීම්වලින් අවසන්ව ඇති අතර ඉතා හොඳ ප්‍රචාරයක් ලබාදුන්න ද මිනීමැරීම් වලින් අවසන්ව ඇත්තේ අතලොස්සකි.

නිරවද්‍ය සිදුවීම් කවරක් වුවත් එවැනි අපරාධ වනාහි විදේශීය ආක්‍රමනිකයන්ට තියුනු ලෙස විරුද්ධ ගෝත්‍ර සමාජයක් මත පදනම්වන සතුරෙකුට එරෙහිව ප්‍රබල වෙඩිබලයෙන් සන්නද්ධ අධිරාජ්‍යවාදී රාජ්‍යයක් විසින් දියත් කරනු ලැබ ඇති ප්‍රතිප්‍රහාරක යුද්ධයක පරම වසයෙන් ම වැලැක්විය නො හැකි අතිරේක නිෂ්පාදනයකි.

මුල දී බහුල වසයෙන් එක්සත් ජනපද මාධ්‍ය ආවරනය නාභිගතව තිබූනේ තනි තනි වෛද්‍ය ආධාර කම්කරුවන්, ඇෆ්ගනිස්ථානය තුල ඔවුන්ගේ දීර්ඝ සේවය සහ ඔවුන්ගේ පවුල් සහ මිත්‍රයන් මත ඇති කල දුක්ඛදායක බලපෑම ගැන වුවද දැන් එම සිද්ධිය යුද්ධය ඉස්මත්තට දැමීමට යොදා ගනිමින් සිටී. නිව් යෝර්ක්හි පලවන එක් කුඩා පුවත්පතක් ''ම්ලේච්ඡයෝ'' යන තනි වචනයේ විශාල උද්ධෘතයක් සහිතව වාර්තා කලේ දැනුවත්ව හෝ නො දැනුවත්ව ඇෆ්ගනිස්ථානය තුල එක්සත් ජනපද පිලිවෙත සහ 19වන ශතවර්ෂයේ දේශීය ඇමරිකානුවන් සමූලෝත්පාඨනයට දැරූ උත්සාහය අතර සම්බන්ධයක් තනමිනි.

සිද්ධිය වනාහි තලිබානයේ ''ඇඹරුනු දෘෂ්ටිවාදය'' හෙලිදරවු කල ''අපචාරී ප්‍රචන්ඩත්වයේ නින්දිත ක්‍රියාවක්'' ලෙස එය හෙලාදකිමින් සහ දැනට වසර නවයක් වන යුද්ධයෙහි එල්බ සිටීමට තම ආන්ඩුවේ අධිෂ්ටානය යලි සහතික කරමින් රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් විසින් නිවේදනයක් නිකුත් කිරීම සමගින් ඔබාමා පරිපාලනය ඉරිදා සිදුවීමෙන් අවශ්‍ය දේශපාලන නිගමනයන් උකහාගැනීම ආරම්භ කලේ ය.

සඳුදා ''තලිබාන් විධික්‍රමය'' යන හිසින් යුතු කතුවැකියක් තුල ඉහත ඝාතනය කිරීම් ''අපගේ සතුරාගේ ස්වභාවය පිලිබඳ අධ්‍යාපනයක් ලෙස විශේෂයෙන් සැලකිය යුතු'' ය යනුවෙන් සඳහන් කරමින් වෝල් ස්ට්‍රීට් ජර්නල් පුවත් පත වඩාත් ඇඟවුම්කාරී සහ ප්‍රතිගාමී නිගමන ලාක්ෂනිකව උපුටා ගත්තේ ය.

''දහස් ගනන් ඇෆ්ගන් ජනතාව එහි ආන්ඩුව සමග සහයෝගී වීමට තරම් නිර්භීත වුවහොත් ඔවුන් දිනපතා මුහුන දෙන අන්තරාය දැකගනු වස් මෙම ඝාතන දර්ශන පථයකි'' යයි ජර්නල් පුවත්පත දිගටම කියාගෙන ගියේ ය. ''ඝාතන සහ විරූපී කිරීම් (කන් සහ අත් කපාදැමීම) වනාහි ආන්ඩුවට රහස් තොරතුරු එකතුකර ගැනීම සහ ජනතාව දිනාගැනීම සඳහා සේවාවන් සැපයීම අපහසු කිරීමට සැකසූ යුද උපායකි.''

ඇෆ්ගන් ජනයාගෙන් අතිමහත් බහුතරය එක්සත් ජනපදය නායකත්වය දෙන වාඩිලාගැනීමට සහ කාබුල්හි වොෂින්ටනයේ රූකඩ ආන්ඩුවට විරුද්ධ ය යන සුප්‍රකට සත්‍යය මෙමගින් නො තකා හැරේ. තව ද පෙන්ටගනය විසින් මෙහෙයවනු ලබන ඉහල තාක්ෂනයෙන් යුතු යුද යන්ත්‍රනය එහි ගොදුරුවල සිරුරු මත වඩාත් නරක හානියක් සිදුවන්නේ එක්සත් ජනපද කර්තෘ කාර්යාලවල සිටින හොඳින් ගෙවනු ලබන ප්‍රතිගාමීන්ගෙන් කිසිදු කඳුලක් නො සැලෙද්දී ය.

''මෙම යුද්ධයේ දී එක්සත් ජනපදයේ ප්‍රධාන මූලෝපායික අභිප්‍රාය වන්නේ අල්කයිඩා රජදහනක් බිහිවීම වැලැක්වීමේ දී පැවතිය යුතු ස්වයං ආරක්ෂාව යි. එහෙත් ඉස්ලාමීය රැඩිකලුන්ට අහිංසක පුද්ගලයින් දහස් ගනනකට හානි කිරීමේ සහ ඔවුන්ව මරාදැමීමේ හැකියාව දෙන්නා වූ පාලනයක් ලබාදෙන ජයග්‍රහනයක් හිමිවීම වැලැක්වීමේ සදාචාරාත්මක අත්‍යවශ්‍ය භාවය ද අපගේ පිලිවෙතට ඇතුලත් වේ'' යයි ජර්නලය නිගමනය කරයි.

මෙමගින් ඇෆ්ගනිස්ථානය ආක්‍රමනය කිරීමට මූලික පදනම ලෙස දැක්වූ සැප්තැම්බර් 11 ත්‍රස්ත ප්‍රහාරයට පලිගැනීම සඳහා ය යන මිථ්‍යාව, ඇමරිකානු මාධ්‍ය මෙතරම් අනලස්ව ප්‍රචාරය කරනු ලබන ''සදාචාරමය'' සහ ''මානවවාදී'' තර්කනය සමග සම්බන්ධ කෙරේ.

ටයිම් සඟරාවේ මුල් පිටුවේ ඡායාරූපය පලකලේ මන්ද යන්නට හේතුදැක්වීමේ දී විධායක කර්තෘ ස්ටෙන්ජල් ''විකිලීක්ස් වෙබ් අඩවිය විසින් වඩා ප්‍රචලිත ලෙස සංගෘහිත ලියකියවිලි පලකිරීම දැනට ම යුද්ධය පිලිබඳ විවාදය ආපසු හරවා ඇත'' යන හෙලිදරවුකාරී සැඳහුමක් කරයි. විකිලීක්ස් කෙරෙහි පවතින කෝපාවිෂ්ට සතුරුභාවයට ප්‍රධාන හේතුවක් වන්නේ අන්තර් ජාලය මත පදනම් වන මෙම කුඩා සංවිධානය, සංගතවලින් පාලනය කෙරෙන යෝධ මාධ්‍ය යන්ත්‍රනය විසින් පවත්වාගෙන යනු ලබන ස්වයං-වාරනය බිඳදැමීම යි.

ප්‍රධාන පුවත්පත් සහ සඟරාවල කතුවරු, විධායක නිලධාරීහු, නිෂ්පාදකයෝ සහ ප්‍රධාන රූපවාහිනී නාලිකාවල මුල් පුටු දරන්නෝ යන තීරන ගැනීමේ භූමිකාව ඉටුකරන අය ඇෆ්ගනිස්ථානය තුල කෙරෙන යුද්ධයේ ස්වභාවය හොඳින් ම දනිති. විකිලීක්ස් හෙලිදරවු කිරීම් ඔවුන්ට අලුත් නො වේ. ඇමරිකානු යුද්ධයේ කෘෘරත්වය දැනුවත්ව සැඟවීම හරහා ඔවුහු අධිරාජ්‍යවාදයේ අපරාධවලට උදවු කිරීමේ ප්‍රමුඛ භූමිකාවක් ඉටුකරති.

**පැට්රික් මාටින්**

.
© www.wsws.org